**අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ (බන්ධනාගාර කටයුතු අංශයේ) ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ විධායක සේවා ගණයේ I ශ්‍රේණියේ තනතුර**

ඉහත තනතුර සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ/ විධායක සේවා ගණයේ I ශ්‍රේණියේ නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. පුරප්පාඩු ගණන එකකි.
සේවයේ/ සේවා ගණයේ I ශ්‍රේණියේ අයදුම්කරුවන් නොමැති අවස්ථාවක දී වසර හතරක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සහිත සේවයේ/ සේවා ගණයේ II ශ්‍රේණියේ අයදුම්කරුවන් තනතුරෙහි පූර්ණ කාලීනව රාජකාරී ඉටුකිරීම සඳහා පත්කිරීම සලකා බලනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභා පටිපාටික රීති 121 ට යටත්ව, අවස්ථානුකූලව පත්කිරීමේ වලංගු කාලය තව දුරටත් දීර්ඝ කිරීමට ද ඉඩ ඇතිව, රාජකාරී ඉටුකිරීමේ පත් කිරීම් වරකට උපරිම වසරක කාලයකට වලංගු වන පරිදි සිදු කරනු ලැබේ.

අයදුම්කරුවන් මීට අමුණා ඇති නියමිත ආකෘතියට අනුව පමණක් සකස් කළ තම අයදුම්පත් **ලේකම්, අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය, නො 19, ශ්‍රී සංඝරාජ මාවත, කොළඹ 10** යන ලිපිනයට 2023 මාර්තු 30 දිනට පෙර ලැබෙන පරිදි තම දෙපාර්තමේන්තු ප්‍රධානී මඟින් යොමු කළ යුතුය.

ප්‍රමාද වී ලැබෙන, අසම්පූර්ණ හා නියමිත අයදුම්පත් ආකෘතියට අනුව සකසා නොමැති අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**2.0 සුදුසුකම්**

**2.1 පළපුරුද්ද හා වෘත්තීය සුදුසුකම්**

i. පුනරුත්ථාපන හෝ අධිකරණ ක්ෂේත්‍රයේ හි අවම වශයෙන් වසර 03ක පළපුරුද්ද ඇති අයදුම්කරුවන් කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.
ii. සමාජ විද්‍යාව, සමාජ වැඩ, ව්‍යාපෘති කළමනාකරණ ක්ෂේත්‍රයන් හි පශ්චාත් උපාධි සුදුසුකමක් තිබීම.
iii. ඉංග්‍රීසි භාෂාවේ ප්‍රවීණතාවය

## 2.2 ශක්තීන්

I) සැලසුම් සකස් කිරීමට හැකි විය යුතු අතර හොඳින් සූදානම්ව සිටිය යුතුය. කාලයෙන් උපරිම ඵල ගැනීමට සහ සහ ඵලදායිතාවය උපරිම කර ගැනීමට සැමවිටම උනන්දු විය යුතුය.

II) සෑම කෙනෙක් තුළම ඇති විභවය දැකීමටත් ඉගෙනීම, ප්‍රගමනය සහ සංවර්ධනය කරා ඔවුන් දිරිමත් කිරීමටත් හැකි විය යුතුය.

## 2.3 චර්යාත්මක දක්ෂතා

i) කෙනෙකුගේ භූමිකාව ආයතනයේ අරමුණු සමඟ ගැලපෙන ආකාරය සහ එයට සහාය දක්වන ආකාරය අවබෝධ කර ගැනීමට ඇති හැකියාව.

වඩාත් පුළුල් සේවා ප්‍රමුඛතා හඳුනා ගැනීම සහ වැඩ කටයුතු ජාතියේ අවශ්‍යතා සඳහා වන බව සහතික කිරීම.

II) තමාට, අන් අයට සහ සමස්තයක් වශයෙන් ආයතනය සඳහා අඛණ්ඩ ඉගෙනීම සහ සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කිරීමේ හැකියාව.

## 3.0 තෝරාගැනීමේ ක්‍රමය

නියමිත ආකෘතිය අනුව ඉදිරිපත් කර ඇති අයදුම්පත්‍රයේ සඳහන් තොරතුරු හා සම්මුඛ පරීක්ෂණයේ දී යෝෂ්‍යත්වය හා කුසලතාවය ඇගයීමට ලක්කර සුදුසු අයදුම්කරුවන් තෝරා ගැනෙනු ඇත. කෙටි ලැයිස්තුගත කළ අයදුම්කරුවන් සංඛ්‍යාවක් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

## 3.1 ලකුණු පරිපාටිය

| ශීර්ෂය | උපරිම ලකුණු | ඇගයීමේ ක්‍රමය |
|---|---|---|
| **යෝෂ්‍යත්වය**<br>යෝෂ්‍යතම සුදුසුකම්ලත් අයදුම්කරුට උපරිම ලකුණු ලබා දී අනෙකුත් අයදුම්කරුවන්ගේ යෝෂ්‍යත්වයට ඊට සමානුපාතිකව ලකුණු ලබා දෙනු ලැබේ. | 50 | අයදුම්පතෙහි තොරතුරු/ සම්මුඛ පරීක්ෂණය |
| පුනරුත්ථාපන හෝ අධිකරණ ක්ෂේත්‍රයේ පළපුරුද්ද | 20 | |
| වෘත්තීය සුදුසුකම්/ පර්යේෂණ හා නව්‍යකරණය | 10 | |

| | | |
|---|---|---|
| සමාජ විද්‍යාව, සමාජ වැඩ, ව්‍යාපෘති කළමනාකරණය ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි සුදුසුකම් *<br>අ.පර්යේෂණ පාදක පශ්චාත් උපාධිය -ලකුණු 7<br>ආ. පාඨමාලා පාදක පශ්චාත් උපාධිය - ලකුණු 6<br>ඇ. පශ්චාත් උපාධි ඩිප්ලෝමාව - ලකුණු 4<br>ඈ. පශ්චාත් උපාධි සහතිකය - ලකුණු 2<br><br>**2 පුනරුත්ථාපන, අධිකරණ, මානව හිමිකම්, අපරාධ විද්‍යාව ක්ෂේත්‍රයේ පුහුණුවීම් ***<br><br>අ. මාස 03 හෝ ඊට වැඩි කාලයක - ලකුණු 1<br>ආ. දින 10 හෝ ඊට වැඩි කාලයක - ලකුණු 0.5<br>ඇ. දින 3ක් හෝ ඊට වැඩි කාලයක - ලකුණු 0.2<br><br>**4. ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය***<br>අ.පිළිගත් විශ්ව විද්‍යාලයකින්/ රජයේ පුහුණු ආයතනයකින් ලබාගත් ඩිප්ලෝමාවක්/ IELTS(Academic) මුළු ලකුණු 6.5හෝ ඊට ඉහළ, TOEFL – IBT 79 හෝ ඊට ඉහළ, TOEFL – CBT 213 හෝ ඊට ඉහළ, හෝ TOEFL – PBT හෝ ඊට ඉහළ- ලකුණු 02<br><br>ආ. පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ රජයේ පුහුණු ආයතනයකින් ලබා ගත් ඉංග්‍රීසි භාෂාව පිළිබඳ සහතිකයක් - ලකුණු 01<br><br>*සලකුණු කර ඇති ශීර්ෂ යටතේ ඉහළම සුදුසුකමට පමණක් ලකුණු ලබා දෙනු ලැබේ. | | |
| **ශක්තීන්**<br>ඵලදායී ලෙස සිදු කළ යුතු මෙන්ම එසේ සිදුකිරීමට අයදුම්කරුගේ අභිප්‍රේරණයක් ඇති දේ. ඉහත 2.2 වගන්තියෙහි සඳහන් පරිදි | 10 | සම්මුඛ පරීක්ෂණය |
| **චර්යාත්මක දක්ෂතා**<br><br>ඵලදායී ලෙස සිදු කළ යුතු කාර්ය හා කර්තව්‍යයන්. ඉහත 2.3 වගන්තියෙහි සඳහන් පරිදි | 10 | |

සටහන 1 - ඉහත ලකුණු පටිපාටියේ " පිළිගත් විශ්වවිද්‍යාලය" යන්නෙන් ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක් අදහස් කෙරේ.

සටහන 2- ඉහත ලකුණු පටිපාටියේ සඳහන් සියළු පශ්චාත් උපාධි සුදුසුකම් ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාල වලින් ලබාගත් සුදුසුකම් විය යුතු අතර විශ්වවිද්‍යාල නොවන උපාධි ප්‍රදාන ආයතනවලින් ලබා ගෙන ඇති එවැනි සුදුසුකම් එම කොමිෂන් සභාව විසින් පිළිගෙන තිබිය යුතුය.

වසන්තා පෙරේරා
ලේකම්
අධිකරණ, බන්ධනාගාර කටයුතු හා
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය
අංක: 19, ශ්‍රී සංඝරාජ මාවත,
කොළඹ 10.

ලේකම්
අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

දිනය - 2023.03.16

## ආදර්ශ අයදුම්පත

1. අයදුම්කරන තනතුර

2. අයදුම්කරුගේ විස්තර

   I. නම
   II. ජාතික හැඳුනුම්පත් අංකය
   III. වයස
   IV. පදිංචි ලිපිනය
   V. දුරකථන අංක
   VI. විද්‍යුත් ලිපිනය
   VII. සේවයේ ශ්‍රේණිය
   VIII. සේවයට පත් කරන ලද දිනය
   IX. වර්තමාන ශ්‍රේණියට උසස් කරන ලද දිනය
   X. තනතුරු නාමය
   XI. වර්තමාන තනතුරට පත් කරන ලද දිනය
   XII. අමාත්‍යාංශය
   XIII. දෙපාර්තමේන්තුව
   *(වෙනත් තොරතුරු අවශ්‍ය වේ නම් ඇතුළත් කරන්න)*

3. වර්තමාන ශ්‍රේණියේ සේවය පිළිබඳ තොරතුරු

I. වැටුප් රහිත/ අඩ වැටුප් නිවාඩු

| සිට | දක්වා | මුළු කාලය (වර්ෂ/මාස/දින) | නිවාඩු ලබා ගත් කාරණය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

II. කාර්යක්ෂමතා කඩඉම්

| කාර්යක්ෂමතා කඩඉම | සමත්වීමට නියමිත දිනය | සමත් වූ දිනය | කාර්යක්ෂමතා කඩඉමෙන් නිදහස් කරන ලද/ සහන ලබා දෙන ලද ලිපියේ අංකය හා දිනය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |

III. විනයානුකූල ක්‍රියාමාර්ගයකට යටත්ව ඇතිනම්

| චෝදනා පත්‍රයේ අංකය හා දිනය | විනය නියෝගය (විනය නියෝගය මෙතෙක් නිකුත් කර නැත්නම් ඒ බව සඳහන් කරන්න.) | දඬුවම ක්‍රියාත්මක වන දිනය (එනම් වරද සිදු කරන ලද දිනය) | රාජ්‍ය සේවා කොමිෂන් සභා පටිපාටික රීති 186 (II) අනුව සතුටුදායක සේවා කාලය ගණනය කිරීමේ දී ඉවත් කෙරෙන කාලය |
|---|---|---|---|
| | | | |
| | | | |

4.පළපුරුද්ද

4.1 සේවයට පත් කරන ලද දින සිට පළපුරුද්ද

| තනතුර | අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව/ ආයතනය | කාල සීමාව | | තනතුරෙහි රාජකාරී හා වගකීම් ස්වභාවය කෙටියෙන් |
|---|---|---|---|---|
| | | සිට | දක්වා | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

4.2 අදාළ විෂයේ පළපුරුද්ද (රාජකාරී පැවරීම් ලිපිවල සහතික කළ පිටපත් අමුණන්න.)

| තනතුර | අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව/ ආයතනය | කාල සීමාව | | තනතුරෙහි රාජකාරී හා වගකීම් ස්වභාවය කෙටියෙන් |
|---|---|---|---|---|
| | | සිට | දක්වා | |
| | | | | |
| | | | | |
| | | | | |

4.3 ඔබ විසින් බන්ධනාගාර ප්‍රතිසංස්කරණ ක්ෂේත්‍රයේ අත්කරගෙන ඇති දැනුම සාර්ථක ලෙස උපයෝගී කරගෙන විසඳන ලද අභියෝගාත්මක ගැටළුවක් විස්තර කරන්න. (උපරිම වචන 150)

5.වෘත්තීය සුදුසුකම් (අදාළ සහතිකවල සහතික කරන ලද පිටපත් අමුණන්න.)

5.1 පශ්චාත් උපාධි සුදුසුකම්

| පශ්චාත් උපාධි සුදුසුකම් | විෂයය | විශ්වවිද්‍යාලය/ ආයතනය | සුදුසුකම වලංගු වන දිනය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |

5.2 පුහුණුව

| පුහුණුව | ආයතනය/ සංවිධානය | කාලසීමාව |
|---|---|---|
| | | |
| | | |
| | | |

5.3 භාෂා ප්‍රවීණතාවය

| භාෂාව | සුදුසුකම/ ආයතනය/ සංවිධානය | වලංගු දිනය |
|---|---|---|
| | | |
| | | |
| | | |

මගේ දැනුම අනුව ඉහත සියළු තොරතුරු සත්‍ය හා නිරවද්‍ය බව සහතික කරමි.

..................................

අයදුම්කරුගේ අත්සන